ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2017 නොවැම්බර් මස 10 වැනි දින |

## ඉඩම් මිල දර්ශකය - 2017 වසර පළමු අර්ධය

නිශ්චල දේපල අංශයෙහි ප්‍රවර්ධනය අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් දර්ශක කිහිපයක් සම්පාදනය සහ විශ්ලේෂණය කරනු ලබයි. මේ අනුව, 1998 වසරේ සිට කොළඹ දිස්ත්‍රික්කය ආවරණය කරමින්, අර්ධ වාර්ෂිකව ඉඩම් මිල දර්ශකය සම්පාදනය කරනු ලබයි. මෙම දර්ශකය ගණනය කිරීමේ දී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සපයන කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5ක්[1] ආවරණය වන පරිදි ප්‍රදේශ 50ක පමණ ඉඩම් මිල ගණන් භාවිතා කරනු ලබයි. මෙහි දී ඉඩම් භාවිතය පිළිබඳ වන විවිධත්වය සැලකිල්ලට ගෙන නේවාසික, වාණිජ සහ කාර්මික යන ඉඩම් කාණ්ඩ සඳහා අනු දර්ශක තුනක් ගණනය කරනු ලබයි. මෙම අනු දර්ශක තුනෙහි සාමාන්‍යය ඇසුරෙන් ඉඩම් මිල දර්ශකය සම්පාදනය කරනු ලබයි.

### සුවිශේෂී කාර්ය සාධනයන්

**ඉඩම් මිල දර්ශකයෙහි වර්ධනය - 2017 ජූනි**

(වාර්ෂික ලක්ෂමය පදනම මත)

**12.6%**

**2017 ජූනි මස අග දී අනු දර්ශකයන්හි පසුගිය වසරට සාපේක්ෂ වැඩි වීම**

| | |
|---|---|
| නේවාසික ඉඩම් මිල දර්ශකය | 11.9% |
| වාණිජ ඉඩම් මිල දර්ශකය | 11.6% |
| කාර්මික ඉඩම් මිල දර්ශකය | 14.6% |

**ඉඩම් මිල දර්ශකය යටතේ ආවරණය වන කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ**




මූලය: කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

[1] කොළඹ, දෙහිවල, හෝමාගම, කඩුවෙල සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ඉඩම් මිල දර්ශකය සම්පාදනය කිරීමේ දී ආවරණය වේ.

කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් මිල පිළිබඳව වන මෑතකාලීන ප්‍රවණතාවයන් නිරූපණය කරමින් ඉඩම් මිල දර්ශකය 2017 ජූනි මස අග දී පසුගිය වසරට සාපේක්ෂව සියයට 12.6කින් වර්ධනය විය. නේවාසික, වාණිජ සහ කාර්මික යන අනු දර්ශක තුනෙහිම ඉහළ යාම මේ සඳහා හේතු විය. ඉඩම් මිල දර්ශකය සහ එහි අනු දර්ශකයන්හි විචලනයන් මහජන දැන ගැනීම සඳහා පහත දක්වා ඇත.




**වගුව 1: ඉඩම් මිල දර්ශකය සහ එහි අනු දර්ශකයන්හි වාර්ෂික විචලනයන් (සියයට)**

| දර්ශකය | ජූනි 2015 | දෙසැම්බර් 2015 | ජූනි 2016 | දෙසැම්බර් 2016 | ජූනි 2017 |
|---|---|---|---|---|---|
| ඉඩම් මිල දර්ශකය | **12.0** | **14.5** | **12.5** | **12.8** | **12.6** |
| නේවාසික ඉඩම් මිල දර්ශකය | 15.4 | 13.7 | 10.8 | 13.3 | 11.9 |
| වාණිජ ඉඩම් මිල දර්ශකය | 11.8 | 16.4 | 14.0 | 12.2 | 11.6 |
| කාර්මික ඉඩම් මිල දර්ශකය | 8.7 | 13.4 | 12.7 | 13.0 | 14.6 |